**ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය- සංරචක 02 (පළාත් මාර්ග වැඩිදියුණු කිරීම) - 2022**

---

**ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය- සංරචක 02 (පළාත් මාර්ග වැඩිදියුණු කිරීම) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 සැප්තැම්බර් 29 දින එළඹි අංක 5788 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 01 හි 4.2 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතියේ සංශෝධිත මූල්‍ය ගිවිසුමට අනුව, එවකට පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර සියලුම පළාත්වල පළාත් මාර්ග අධිකාරීන් සංශෝධිත සංරචක 02 ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ වත්කම් කළමණාකරණ පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාව ශක්තිමත් කිරීම හා පළාත් මාර්ග සඳහා ප්‍රවේශ හා කළමණාකරණ රාමුව වැඩිදියුණු කිරීම වේ. ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,875 කට සමාන එජඩො මිලියන 125ක් වේ. ව්‍යාපෘතියේ සංශෝධිත මූල්‍ය ගිවිසුමට අනුව, සංශෝධිත සංරචක 02 හි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 19,075කට සමාන එජඩො මිලියන 109ක් වේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 මැයි 02 දින ආරම්භ කර තිබුණු අතර 2023 මාර්තු 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.**

**1.3 මතය**

**ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.**

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා**

ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.1** නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 756 සහ 757 | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | භාණ්ඩ සමීක්ෂණය වාර්ෂික සිදුකළ යුතුය. |
| (ආ) | PS/SP/SB/Circular/06/2019 හා 2019 දෙසැම්බර් 19 දිනැති චක්‍රලේඛය | (i) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/D/7777/TCAMP හා 2019 මාර්තු 30 දිනැති ලිපිය මඟින් පළාත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක හා පළාත් ව්‍යාපෘති උපදේශක සේවා ඒකකවල කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබා දී තිබුණද ඊට පටහැනිව පළාත් | කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් සීමිත කාර්යය මණ්ඩලයක් සේවයේ යෙදවීමට අනුමත කර තිබුණද මෙවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට විශාල සේවකයන් පිරිසක් අවශ්‍ය බැවින් මෙම සේවකයින්ගේ සේවාව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | වයාපෘති උපදේශන සේවා ඒකකවල තනතුරු **07**ක් සඳහා කොන්ත්‍රාත් විචලනයන් යටතේ රු. මිලියන **30** ක් ගෙවා තිබුණි. | ලබාගෙන ඇත. | |
| | **(ii)** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව රත්මලාන පුහුණු ආයතනයේ කළමනාකරණ සහායකයෙකු සඳහා රු.**405,150**ක මුදලක් **WP 03** කොන්ත්‍රාත් පැකේජයේ විචලතා යටතේ ගෙවා තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබෙන තෙක් කාර්යාලයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා කළමනාකරණ සහායකයෙකු සේවයට යොදාගෙන ඇත. | -එම-. |
| **(ඇ)** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය **(2006)** | | | |
| **(i) 4.4** ඡේදය | • රත්මලාන පුහුණු ආයතනයේ ගෙවීම් සැලසුම් උපදේශක සහ වත්කම් කළමණාකරණ උපදේශක තනතුරු සඳහා ඍජු ක්‍රමය යටතේ උපදේශකයන් තෝරා ගැනීමට තීරණය කර තිබුණද, තම අභිමතය පරිදි විනිවිදභාවයකින් තොරව උපදේශකවරුන් තෝරා ගැනීමට කටයුතු කර තිබුණි. | උපදේශක තනතුර සඳහා තෝරාගත් නිළධාරියා සුදුසුකම් සපුරා ඇති අතර ඉල්ලුම්පත ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් වූ අවස්ථාවේ සිට එම නිළධාරියාට සම්බන්ධ පාර්ශවය ප්‍රසම්පාදන කමිටුවෙන් ඉවත්විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කළ යුතු ය. |
| | • රත්මලාන පුහුණු ආයතනය පිරිවිතරවලට ගැලපෙන සාරානුකූල අවම ලංසුව ඉදිරිපත් කළ ආයතනයෙන් භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු නොකිරීමෙන් රු.**912,545**ක මූල්‍ය අලාභයක් සිදුවී තිබුණි. | ලෝක බැංකු ප්‍රසම්පාදන නියමයන්ට අනුකූල වන පරිදි කටයුතු කර ඇත. | -එම- |
| **(ii) 8.13.1** ඡේදය | වයාපෘතියේ වැඩවල ස්වභාවය, ගුණාත්මකභාවය හෝ ප්‍රමාණය වෙනස් කිරීමට කොන්ත්‍රාත් විචලනයන් යොදාගැනීමට සේවා යෝජකයාට බලය පැවරී | වයාපෘති රාජකාරී සඳහා ටෙන්ඩර් කැඳවීම අසාර්ථක වූ බැවින් ලෝක බැංකුවට දන්වා කොන්ත්‍රාත් | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | ඇති පසුබිමක කාර්යමණ්ඩලය සඳහා ගෙවීම්, ව්‍යාපෘති අධ්‍යක්ෂ, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයට වාහන සැපයීම වැනි අමතර වියදම් දැරීමට 2022 සැප්තැම්බර් 30 දක්වා මුළු හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදනයෙන් සියයට 25 එනම් රු. මිලියන 203 ක් කොන්ත්‍රාත් විචලනයන් ලෙස ගෙවා තිබුණි. | පැකේජ තුලින් වාහන ලබා ගැනීම. | |
| (ඇ) | 8.13.4 ඡේදය | හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන ඉක්ම වූ විට ප්‍රසම්පාදන අත්පොතෙහි සඳහන් අධිකාරී මට්ටම අනුව කොන්ත්‍රාත් විචලන නියෝග අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වූවත් 2022 සැප්තැම්බර් 30 දින වන විට පැකේජවල හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන ඉක්මවා රු.මිලියන 229 ක් ගෙවා තිබුණද, ඒ සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | සීමාව ඉක්මවා ගෙවීම් කිරීමේදී නිතර ප්‍රධාන ගණන්දීමේ නිළධාරියගේ අනුමැතිය සඳහා යොමුවීම අපහසු කාර්යයක් වූවද ගිවිසුම්ගත කොන්ත්‍රාත් මුදල ඉක්මවා යන අවස්ථාවේදී අදාල අනුමැතිය ලබා ගනු ඇත. | -එම- |
| (ඉ) | ශ්‍රී ලංකා උපදේශක ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ (2007 අගෝස්තු) | | | |
| | (i) 2.5 ඡේදය | උපදේශක ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා හැර අනෙකුත් සියලු සාමාජිකයන් විසින්, ලැබී ඇති සියලු තාක්ෂණික යෝජනා ස්වාධීනව ඇගයීමට ලක් කර පූර්වයෙන් සකස් කළ වැඩ පත්‍රිකා මත සටහන් කළ යුතු අතර සාමාජිකයින් විසින් ස්වාධීන ඇගයීම අවසන් කිරීමෙන් පසු උපදේශක ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් එම ඇගයීම් කර ලබා දී ඇති විෂමතා සමාලෝචනය කර අවම කිරීම සඳහා සියලු සාමාජිකයින් සමඟ සාමූහිකව සාකච්ඡා කළ යුතු අතර සම්මුතියෙන් සාමාන්‍යයකට එකඟ විය යුතුය.<br><br>එහෙත් එසේ කටයුතු නොකර | සුදුසුකම් හා පළපුරුද්ද වැඩි දුරටත් පරික්ෂා කිරීම සඳහා අනුකමිටුවක් පත්කර ඇත. | උපදේශක ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සම්මුඛ පරීක්ෂණ පවත්වා උපදේශකයින් තෝරාගෙන තිබුණි. | | |
| | (ii) 2.6.2 ඡේදය | රත්මලාන පුහුණු ආයතනය සඳහා උපදේශකයින් බඳවාගැනීමේදී අමාත්‍යාංශ උපදේශන ප්‍රසම්පාදන කමිටුව විධිමත් පරිදි පත්කර නොතිබුණ අතර ප්‍රසම්පාදන අස්ථිත්වයට ගැලපෙන පරිදි ප්‍රසම්පාදන කමිටුවේ සංයුතිය සකස්කර නොතිබුණි. | සුදුසුකම් හා පළපුරුද්ද වැඩි දුරටත් පරික්ෂා කිරීම සඳහා අනුකමිටුවක් පත්කර ඇත. | -එම- |
| (ඊ) | 2019 මාර්තු 05 දිනැති අංක 1/2019 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛ | ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම මාස 02 කට වරක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ පවත්වා ඇත්තේ රැස්වීම් 03ක් පමණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු විධිමත්ව පැවැත්විය යුතුය |
| (උ) | 2019 ජනවාරි 12 දිනැති අංක 01/2019 දරණ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් තුනක් පමණක් පවත්වා ඇත. | පිළිතුරු ඉදිරිපත් කර නැත | විගණන හා කළමනාකරණ කමිටු විධිමත්ව පැවැත්විය යුතුය |

3. භෞතික කාර්යසාධනය

3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති කළමණාකරණ ඒකකය විසින් ප්‍රධානය කළ කොන්ත්‍රාත් පැකේජ 26 න් දැනට ක්‍රියාත්මක කොන්ත්‍රාත් 18ක කාලය දින 162 සිට දින 597 ක පරාසයක් දක්වා දීර්ඝ කිරීම් අනුමත කර තිබුණද, 2022 දෙසැම්බර් 31 දින වන විටත් කොන්ත්‍රාත් නිම කරගැනීමට කටයුතු කර නොතිබුණි. | සියයට 75 ක ප්‍රගතියක් ළගාකරගෙන ඇත | ව්‍යාපෘතිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රතිව්‍යුහගත පත්‍රිකාවේ ඇතුලත් කරන ලද එකඟවූ සැලැස්මට අනුව කොන්ත්‍රාත් පැකේජ 18 න් 17 කම අදියර 1, පියවර 1 හා පියවර 11 හි ප්‍රමාද කාලයක් සහිතව ප්‍රධානය කර තිබූ අතර එම පැකේජවල ඉදිකිරීම් නියමිත දිනට නිම කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත්කල මිල ගණන් ඉහළ අගයක් ගැනීම,ජනාධිපත්වරණය සහ නිලධාරීන්ගේ ස්ථාන මාරු යන කරුණු නිසා නියමිත දිනට කොන්ත්‍රාත් ප්‍රධානය කිරීමට නොහැකි විය | -එම- |

**3.2** මතභේදාත්මක ස්වභාවයේ ගැටළු

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/D/7777/TCAMP හා 2019 මාර්තු 30 දිනැති ලිපිය මඟින් පළාත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක හා පළාත් ව්‍යාපෘති උපදේශක සේවා ඒකකවල කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එම අනුමැතියට පටහැනිව කොන්ත්‍රාත් බිල්වල BOQ අයිතමයක් ලෙස තනතුරු 05ක් සඳහා රු. මිලියන 80ක් ගෙවා තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් සීමිත කාර්යය මණ්ඩලයක් සේවයේ යෙදවීමට අනුමත කර තිබුනද මෙවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට විශාල සේවකයන් පිරිසක් අවශ්‍ය බැවින් මෙම සේවකයින්ගේ සේවාව ලබාගෙන ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) | NWP 03 පැකේජයේ බිල් අංක 15 (IPC 15) හි, කොන්ත්‍රාත් ගිවිසුමේ 20.1 වගන්තිය යටතේ හිමිකම් පෑම් ලෙස රු. මිලියන 2 ක මුදලක් ප්‍රධාන නේවාසික ඉංජිනේරු, නේවාසික ඉංජිනේරු සහ සහායක නේවාසික ඉංජිනේරුවන්ට වාහන සැපයීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුමට අනුව එකඟ වූ (BOQ) වටිනාකම ඉක්මවා කොන්ත්‍රාත්තුව ආරම්භයේ සිට 2022 මාර්තු 31 දින දක්වා වූ සම්පූර්ණ කාලයට සංශෝධිත වටිනාකම අනුව ගණනය කිරීම් සිදු කර ගෙවා තිබුණි. | ගිවිසුම යටතේ කොන්ත්‍රාත්කරු කරන ලද ඉල්ලීමක් සලකා බැලීමෙන් අනතුරුව, හිමිකමක් තිබෙන බව තහවුරු කර ගෙවීම සිදුකර ඇත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඇ) | රත්මලාන පුහුණු ආයතනයේ තනතුරු සඳහා උපදේශකයන් තෝරා ගැනීමේදී අපේක්ෂකයන්ගේ මිල යෝජනා තුල සහ ප්‍රසම්පාදන දැන්වීමේදී ප්‍රවාහන පහසුකම්, වාහන වෙන් කිරීම පිළිබඳ කිසිඳු සටහනක් නොවූවද උපදේශක ගිවිසුම්වල වාහනයක් ලබාදෙන බවට කොන්දේසියක් ඇතුළත් කර තිබුණි. ඒ අනුව වයඹ පළාතේ මාර්ග කොන්ත්‍රාත්කරුවන් මඟින් ඔවුන් වෙත වාහන ලබා දීමට කටයුතු කර තිබුණි. | යෝජනා කැඳවීමේදී ඇතුලත් නොවුවද වසර 20 කට එහා ගිය පිලිවෙතක් අනුව අවශ්‍ය පහසුකම් ලබා දීම සිදු කරමින් පවතී | ව්‍යාපෘතිය විසින් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කල යුතු ය. |
| (ඈ) | රත්මලාන පුහුණු ආයතනයේ වත්කම් කළමණාකරණ උපදේශක තනතුර සඳහා. බඳවා ගත් උපදේශක වරයා ගිවිසුම් ප්‍රකාරව සේවය අවසන් කර නොතිබූ අතර එම කාලය තුල සිදුකලයුතු ක්‍රියාකාරකම්ද සිදුකර නොතිබුනෙන් සේවා කාලය තුලදී අපේක්ෂිත ප්‍රගතිය අත්කරගෙන නොතිබුණි.<br>මේ වන විටත් ස්ථාපිත කර අවසන් කළ යුතු වත්කම් කළමනාකරණ ඒකකය පිහිටුවා නොමැති බැවින් මෙම උපදේශකවරයා වෙත ගෙවන ලද පාරිශ්‍රමිකය වන රු. මිලියන 3 නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | රටේ පැවති තත්ත්වය මත අපේක්ෂිත ප්‍රගතිය අත්පත්කර ගැනීම ප්‍රමාද වූ අතර වෙනම ඒකකයක් පිහිටුවා නොමැති වුවත් මේ වන විටත් මාර්ග වත්කම් කළමණාකරණය සඳහා අවශ්‍ය දත්ත රැස්කිරීම ආරම්භ කර ඇත. | වත්කම් ඵලදායීව භාවිතා කිරීම කළයුතු ය. |

**3.3** වැඩබිම් පරීක්ෂාවේදී කරණ ලද නිරීක්ෂණ

**(අ) මධ්‍යම පළාත - ගොඩමුන්න කිතුල්පේ මාර්ගය**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (i) | කොන්ත්‍රාත් ගිවිසුමේ අංක 8.3 යටතේ කොන්ත්‍රාත්තුව වැඩ සැලැස්මෙන් බැහැර වන අවස්ථා වලදී කොන්ත්‍රාත්කරු විසින් සංශෝධිත වැඩ වැඩසටහනක් ඉදිරිපත් කර උපදේශක ඉංජිනේරුවරයා විසින් අනුමත කළ යුතු වුවද, එවැනි සංශෝධිත වැඩසටහනක් අනුමත කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම සලකා බැලීමෙන් පසු කොන්ත්‍රාත් කාලය 2022 ජුනි 22 දක්වා දීර්ඝ කර ඇති අතර කොන්ත්‍රාත්කරු විසින් සංශෝධිත වැඩ වැඩසටහනක් ඉදිරිපත් කර උපදේශක ඉංජිනේරුවරයා විසින් අනුමත කරන ලදී. කොන්ත්‍රාත්තුව නිම කිරීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් ප්‍රමාද ගාස්තු අය කරන බව කොන්ත්‍රාත්කරුට ලිඛිතව දන්වා තිබුණි. | වැඩ සැලසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ii) | BOQ හි අයිතම අංක 506 (1) b යටතේ ඇස්ෆෝල්ට් මිශ්‍ර විශ්ලේෂණ පරීක්‍ෂණය අසාර්ථක වුවද, මිලිමීටර් 50 ක ඝනකම සහිත වර්ග මීටර් 16,160 ක මතුපිටට ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් සඳහා රුපියල් මිලියන 5ක් ගෙවා තිබුණි. | මිශ්‍රණයේ ඉතා කුඩා පාෂාණ අංශු තිබීම එහි ගුණාත්මක භාවයට හානියක් නොවන අතර මතුපිට ලිස්සායාමේ ප්‍රතිරෝධය තරමක් වැඩි කිරීමට උපකාරී වේ. වාහන ගමනාගමනය අතරතුර මතුපිට ලිස්සා යාමේ ප්‍රතිරෝධය මගින් ආරක්ෂාව වැඩි දියුණු කරයි. | නියම කර ඇති පරිදි ගුණාත්මක අමුද්‍රව්‍ය භාවිතා කළ යුතුය. |
| (iii) | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව කොන්ත්‍රාත්කරු විසින් තත්ත්ව පරීක්ෂණාගාරයක් පවත්වාගෙන යා යුතු අතර රසායනාගාර උපකරණ භාවිතා කිරීමට පෙර උපදේශක ඉංජිනේරුවරයාගෙන් අනුමැතිය ලබාගෙන උපකරණ ක්‍රමාංකනය කර තිබිය යුතුය. කෙසේ වෙතත් එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබූ අතර කොන්ක්‍රීට් සම්පීඩන පරීක්ෂණ යන්ත්‍රය සහ CBR යන්ත්‍රය සඳහා ක්‍රමාංකනය කර නොතිබුණි. | රසායනාගාර සහ විද්‍යාගාර උපකරණ සඳහා අනුමැතිය නේවාසික ඉංජිනේරුවරයා විසින් ලබා දෙන ලදී. කොන්ක්‍රීට් සම්පීඩන පරීක්ෂණ යන්ත්‍රය සහ CBR යන්ත්‍ර සඳහා ක්‍රමාංකනය RE කාර්යාලයට අනුයුක්ත කරන ලද පරීක්ෂණ නිලධාරියෙකු විසින් සිදු කරන ලදී. ගෙවීම් ප්‍රමාදය හේතුවෙන් ක්‍රමාංකන වාර්තා කොන්ත්‍රාත්කරු වෙත ඉදිරිපත් කර නොතිබුණි. කොන්ත්‍රාත්කරු වාර්තාව ලැබුණු විගස RE කාර්යාලයට ඉදිරිපත් කෙරේ. | තත්ත්ව පාලන ක්‍රමය නිලධාරීන් විසින් අනුගමනය කළ යුතුය. |
| (iv) | මාර්ග උරහිස් ඉදිකිරීමෙන් පසු ABC සහ ඇස්ෆෝල්ට් දැමීම ආරම්භ කළ යුතුව තිබුණද, මාර්ග උරහිස් ඉදිකිරීමට පෙර ABC මීටර් 646 ක් සහ ඇස්ෆෝල්ට් දැමීම මීටර් 770 ක් අවසන් කර ඇත. | ශ්‍රී ලංකාවේ භාවිතයක් ලෙස, එක් ක්‍රමයක් වන්නේ මාර්ග උරහිස් ඉදිකිරීමෙන් පසු පටු මාර්ගවල ABC දැමීම වන අතර අනෙක් ක්‍රමය වන්නේ ABC යෙදීමට පෙර මාර්ග උරහිස් ඉදිකිරීමයි. මෙහිදී, මාර්ගයේ නියමිත පළලට වඩා දෙපස මිලිමීටර් 250 ක් පමණ වැඩිපුර ABC යොදනු ලැබුවද | සම්මත ක්‍රමවලට අනුව වැඩ නිම කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | | අමතර ABC සඳහා ගෙවීමක් සිදු නොකෙරේ. මෙය පාර්ශ්වීය ආධාරකයක් යෙදීමෙන් මාර්ගයේ ABC/ ඇස්ෆෝල්ට් ස්ථාවර කරයි. එය ABC/ඇස්ෆෝල්ට් වල ගුණාත්මක භාවයට සෘජු හානියක් සිදු නොකරයි. | |
| (v) | මායිම පුළුල් කිරීමේ කාර්යයේ දී උප පාදක වර්ගය 01 සඳහා ABC ආදේශ කර ඇත. එබැවින් කොන්ත්‍රාත්කරුට මායිම පුළුල් කිරීමේ කාර්යයේ දී රුපියල් 696,018 ක අමතර මුදලක් ගෙවා තිබුණි. | පාරිසරික බලපෑම මත පස වෙනුවට ABD භාවිතා කිරීමට ව්‍යාපෘතිය අනුමත කර ඇත. | BOQ අනුව වැඩ අවසන් කළ යුතුය |

(ආ) වයඹ පළාත - එන්ඩබ්ලිව්පී 01/02/03

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (i) | මෙම පැකේජයේ මාර්ග 12ක් අතරින් මාර්ග 4 ක් සංවර්ධනය ශක්‍යතා අධ්‍යන සහිතව නිසි ක්‍රමවේදයක් භාවිත නොකර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් තෝරාගෙන තිබුණු අතර අනෙකුත් මාර්ග 08 දේශපාලන අධිකාරිය විසින් කරන ලද ඉල්ලීම් පරිදි තෝරාගෙන තිබුණි. කෙසේවෙතත්, 2015 සිට 2020 දක්වා පසුගිය වර්ෂ 05 තුළදී එම තෝරාගත් මාර්ග නඩත්තු කිරීම සඳහා එකතුව රු.මිලියන 33.1ක් වැයකර තිබුණි. | 2015 සිට 2020 දක්වා නඩත්තු වියදම් 2022 මාර්තු 29 දිනැති අංක PRDA/1/3/17/22 දරන පළාත් අධ්‍යක්ෂකගේ ලිපිය මගින් විගණනය වෙත යවා තිබුණි. | සංවර්ධනය සඳහා මාර්ග තෝරා ගැනීමට පිළිගත හැකි ක්‍රමවේදයක් භාවිත කළ යුතුය. |
| (ii) | පුහුරිය - පොල්ගහවෙල මාර්ගය ඇස්තමේන්තුවට අනුව එක් අයෙකුට රු.75,000 බැගින් බෝක්කු පිරිසිදු කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. බෝක්කු 22 ක් තිබී ඇති අතර ඒවායින් බොහොමයක් නිසි පරිදි පිරිසිදු කර නොතිබුණි. නමුත් රු.මිලියන 1 ක මුදලක් නිශ්කාර්ය ලෙස ගෙවා තිබුණි. | මාර්ගය 2021 ජූලි මාසයේදී සේවායෝජකයා විසින් පවරා ගන්නා ලද අතර කොන්ත්‍රාත්කරු විසින් මෙම සියලුම බෝක්කු නිසි ලෙස පිරිසිදු කර මඩ ඉවත් කරන ලදී. කෙසේ වෙතත්, එම මාර්ග නඩත්තු කිරීම 2021 නඩත්තු සැලැස්මට ඇතුළත් කර නොමැත. තවද එම වකවානුවේ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අරමුදල් නොමැතිකම, මාර්ග තෝරා ගැනීමේ ප්‍රමුඛතාවය නොමැතිකම සහ 2022 දී රට තුළ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් මෙතෙක් නඩත්තු කිරීමට නොහැකි වී තිබේ. රටේ වත්මන් තත්ත්වය සහ මේ වසරේ ඉතිරි කාලය සඳහා ප්‍රතිපාදන ලැබීමේ ප්‍රමුඛතාවය සැලකිල්ලට ගෙන ඉදිරියේදී නඩත්තු කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වේ. | නියමිත කාල සීමාව තුළ සම්මත ක්‍රමවලට අනුව සහ BOQ මගින් නියම කර ඇති පරිදි වැඩ කළ යුතුය. |

**3.4 ව්‍යාපෘති අරමුණුවලින් බාහිර ක්‍රියාකාරකම්/ ගෙවීම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතියේ ප්‍රතිපාදනවලින් රු. මිලියන 22.2 ක මුදලක් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සහ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ රජයේ සේවයේ නියුතු ඉංජිනේරුවන් සඳහා ඔවුන්ගේ වෘත්තීය සුදුසුකම් සපුරාලීම සඳහා. යොදවා තිබුණි. | ශ්‍රී ලංකා වරලත් ඉංජිනේරු සභාවේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා ධාරිතා ගොඩනැගීම සඳහා ලැබෙන මුදල් වෙන් කිරීම ව්‍යාපෘති අරමුණුවලට පටහැනි නොවේ. | ණය ගිවිසුමෙන් අනුමත ව්‍යාපෘති අරමුණු සඳහා පමණක් ප්‍රතිපාදන යෙදවීමට කටයුතු කළ යුතුය. |

**3.5 පද්ධති හා පාලනයන්**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන ක්‍රියාවලියක් සිදු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අභ්‍යන්තර විගණනය නිසි ලෙස ක්‍රියාත්මක විය යුතුය. |
| (ආ) | උපදේශකයින් සඳහා ලෙජරයේ පාලන ගිණුමක් පවත්වා ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | පොත් සහ වාර්තා නිසි ලෙස යාවත්කාලීන කර තබා අවශ්‍ය විටෙක විගණනයට ඉදිරිපත් කළ යුතුය. |